2025 වසර සඳහා වන
වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය - 01

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේසාරාංශය

1.1. හැඳින්වීම

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ක්‍රිස්තියානිධර්මයේ සහ සංස්කෘතියෙහිපැවැත්ම හා වර්ධනය සඳහාරජයේ ප්‍රතිපත්තිය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2. දැක්ම

ක්‍රිස්තියානි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ක්‍රියාකිරීම

මෙහෙවර

ක්‍රිස්තියානි ධර්මයේ සහ සංස්කෘතියෙහි වටිනාකම් හා විශ්වාසයන් සමාජයේ පිළිගත් ආකාරයට ප්‍රවර්ධනය කිරීම

අරමුණ

සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීම හා අධීක්ෂණය.

1.3. ප්‍රධාන ක්‍රියාකාරකම්

1. වන්දනාගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරීම.
2. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.
3. කිතුණු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරුසේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
4. කිතුණු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම.
5. බයිබලීය දැනුම වර්ධනය කිරීම උදෙසා බයිබල් දැනුම මිනුම තරගය පැවැත්වීම.
6. කිතුණු ජනතාවගේ අති උතුම් මංගල්‍ය වූ පාස්කු මංගල්‍යට අදාල වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
7. කිතුණු ජනතාවගේ ගෞරවාදරයට පත් උතුම් මංගල්‍ය වූ නත්තල් උත්සවය සඳහා දායකත්වය ලබාදීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම.
8. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරීම.
9. කිතුණු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
10. දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීම.
11. පෞරාණික දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම
12. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
13. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
14. කිතුණු දේශීය පැවිදි පාර්ශව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
15. කතෝලික දේවස්ථාන,දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
16. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘතීන්

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වෙසෙන කිතුනු ජනතාව සියවස් ගණනක් මුළුල්ලේ ස්වකීය ආගමික මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධ වෙමින් සිය ආගමික පූජාවන් පවත්වන ලද නමුත් එකී ආගමික සංවිධාන හා රජය අතර සෘජු ක්‍රමික සබඳතාවක් ගොඩනැගී නොමැත .එසේ නමුත් හැමවිටම සෑම රජයක් යටතේම සිය ආගම් ඇදහීමේ නිදහස ඔවුනට හිමිවිය.

පසුගිය දශකයක පමණ කාලය තුළ **'සියලුම ආගම් වලට සමානව සැළකිය යුතුය'**යන සංකල්පය යටතේ කිතුනු ජනතාව හා ඔවුන්ගේ වන්දනාවට පාත්‍රවූ ආගමික සිද්ධස්ථාන කෙරෙහි රජයක් වශයෙන් ඉටුකළ හැකි මෙහෙය ඉතා පුළුල්වෙමින් වර්ධනය වූ අතර කිතු බැතිමතුන් හා පූජ්‍ය පක්ෂය කෙරෙහි රජයේ අවධානය වැඩිවශයෙන් යොමු විය .එහි ප්‍රතිඵලයක් ලෙස කිතුනු ආගමික සංස්ථාව තුළත් ආගමික මධ්‍යස්ථාන හා රජය අතරත්අන්නෝන්‍ය විශ්වාසය හා සම්බන්ධතාවය ක්‍රමවත් ලෙස වර්ධනය විය.

කිතුනු ආගමික වත්පිළිවෙත් ඉටුකරණු වස් පුදපූජා පවත්වමින් ආගමික ඇවතුම් පැවතුම් ගුණ ධර්ම වර්ධනය කිරීමේ මූලික අඩිතාලම ගොඩනගනුයේ ගම්වල හා නගරවල පිහිටි ආගමික සිද්ධස්ථාන මඟිනි.රෝමානු කතෝලික සභාව හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධ ක්‍රිස්තියානි සභාවන්ගේ එකමුතුව ඇතිව එකී සිද්ධස්ථාන මූලික කරගෙන අධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් කිතුනු ජනතාව සංවර්ධනය කිරීමටත් ,සදාචාර සම්පන්න දූදරුවන් අනාගතයට දායාද කිරීමටත් වශ්‍ය අනුග්‍රහය රජය හා අනෙකුත් ආයතන මඟින් ලබාදීමත් අපගේ සේවාවයි.

1999වර්ෂයේ මැයි මසදි කැබිනට් පත්‍රිකාවක් මඟින් සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යංශය යටතේ ක්‍රිස්තියානි ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලෙස ඇරඹි මෙම දෙපාර්තමේන්තුව පසු වර්ෂ කිහිපය තුළ විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් විවිධ අමාත්‍යංශ මෙන්ම අමාත්‍යවරු යටතේ ක්‍රමිකව විකාශනය වන්නට විය2007 .ක් වූ අගෝස්තු මස 01වන දින සිට වඩාත් සක්‍රිය දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වඩාත් සංවිධිත හා ක්‍රමවත්ව වර්ධනය වූ අතර එකී කාර්යභාරය අංශ හතරක් යටතේ ක්‍රියාත්මක වන්නට විය .ඒවා නම්,

- **පාලන අංශය**
- **සංවර්ධන අංශය**
- **ගිණුම් අංශය**
- **අභ්‍යන්තර විගණන අංශය**

❖ පාලන අංශය

දෙපාර්තමේන්තුවේ ආයතනික ,පරිපාලන හා කළමනාකරණ කටයුතු මෙහෙයවමින් , අරමුණු ඉටුකිරීමෙහිලා සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම මෙම අංශයෙන් ඉටු එම.කරනු ලබන කාර්යයයි කාර්යය පහත පරිදි වේ.

1. කාර්ය මණ්ඩලයේ සියලු නිළධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු වලට අදාලව සියලු ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
2. පුරප්පාඩු සඳහා නවක නිළධාරින් බඳවා ගැනීමට අදාලව කටයුතු හා බඳවාගැනීමේ පටිපාටි ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
3. යම් යම් අවස්ථාවලදි ඉල්ලනු ලබන පරිදි ආයතනික තොරතුරු හා වාර්තාවන් ලබාදීම.
4. නිළධාරින්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් වලට අදාළ රාජකාරි කටයුතු.
5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ සහ අනෙකුත් සියලු චක්‍රලේඛ යාවත්කලීනව පවත්වාගෙන යාම.
6. ආයතනයේ දුරකතන, විදුලිය, ජලය, ගොඩනැගිලි හා අනෙකුත් විවිධ වියදම්සම්බන්ධව බිල්පත් නිරවුල් කිරීමට ඉදිරිපත් කිරිම හා නඩත්තු කිරීමේ කටයුතු කිරීම.
7. ආරක්ෂක සේවා සැපයීම,පවිත්‍ර කිරීමේ සේවා සැපයීම, පරිගනක යන්ත්‍ර සේවා කිරීමේ කටයුතුඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම, ෆැක්ස් යන්ත්‍ර හා අනෙකුත් ගිවිසුම්ගත සේවා කටයුතු වලට අදාල සියලු රාජකාරි කිරිම.
8. දෛනික පැමිණීමේ විස්තර යාවත්කාලීනවපවත්වාගෙනයාම,රාජකාරි නිවාඩු, දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම, නිරවුල් කිරිම හා දුම්රිය ප්‍රවේශපත්‍ර ගොනුව නඩත්තු කිරිම.
9. දෛනික පැමිණීමේ විස්තර යාවත්කාලීනව පවත්වාගෙනයාම, රාජකාරි නිවාඩු, දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම, නිරවුල් කිරිම හා දුම්රිය ප්‍රවේශපත්‍ර ගොනුව නඩත්තු කිරිම.
10. අග්‍රහාර විෂයට අදාලව සියලු රාජකාරි කටයුතු.
11. ණය අයදුම්පත් ලබාගැනීම හා ඒවා සම්පූර්ණ කර ගිණුම් ශාඛාවට ඉදිරිපත් කිරීම.
12. වාහන නඩත්තුව හා ප්‍රවාහනයට අදාලව සියලුම රාජකාරී.
13. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශ ලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
14. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
15. කිතුණු දේශීය පැවිදි පාර්ශව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
16. කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
17. තොරතුරු දැනගැනීමේ පණතේ විධිවිධාන යටතේ බාහිර පාර්ශවයන් වෙත තොරතුරු ලබා දීම.
18. දෙපාර්තමේන්තුවෙන් ද වෙබ් අඩවිය යාවත්කාලීන කොට පත්වාගෙන යාම

❖ **සංවර්ධන අංශය**

දෙපාර්තමේන්තුව සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන හා වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් යොදවාගෙන දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කෙරෙන අන්දමේ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම .ලැබෙන අරමුදල් යොදවා කරනු ලබන ව්‍යාපෘති ආගමික හා සාමාජික වශයෙන් දියුණුවක් ඇති කිරීම සඳහා දේවස්ථාන කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු සංවිධානය හා සමායෝජනය කිරීම .ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අවශ්‍ය අරමුදල් ලබාදීම හා ප්‍රගතිය මැන බැලීම.

ඉහත කාර්යභාරය සංවර්ධන අංශය මඟින් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.

01. වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාවවිසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හී සංවර්ධන කාර්යයන් සිදුකිරිම.
02. ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.
03. ආර්ථික වශයෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති වසර සියයකට වඩා පැරණි දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරිම සඳහා ආධාර ලබාදීම.
04. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර කිරීම.
05. ආර්ථික සහය අවශ්‍ය කිතුණු ආගමික ආයතන සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර කිරීම.
06. කිතුනු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම
07. දහම් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම
08. දහම් ගුරුවරුන් සඳහා දීමනා ලබා දීම
09. කිතුනු ආගමික සාහිත්‍ය ,කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරිම.
10. කිතුණු කලා කරුවන් ඇගයීම
11. කිතුණු කතුවරුන්ගේ ප්‍රකාශ මිල දී ගැනීම හා දහම් පාසල් පුස්තකාල සඳහා පොත් ලබා දීම
12. කිතුනු ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ නත්තල් උත්සව සඳහා දායකත්වය ලබාදීම.
13. නත්තල් තැපැල් මුද්දර නිකුත් කිරීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම.
14. කිතුනු ජනතාවගේ වන්දනාවට පාත්‍ර වූ පාස්කු වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
15. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරිම.

කිතුනු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය අරමුණු කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මකකිරීම

❖ ගිණුම් අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ හා ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ ආයතන අංශය හා සංවර්ධන අංශය මඟින් ඉටුකරනු ලබන සියලුම කාර්යභාරයන්ගේ අවසන් ක්‍රියාවලිය වන මූල්‍යමය වගකීම නිසියාකාරව මෙහෙයවීම හා නිවැරදිව ඉටුකරනු ලැබීම මෙහි කාර්යභාරය වෙයි.

එම කාර්ය පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලබයි.

01. සියලුම ගෙවීම් කටයුතු සම්බන්ධව වවුචර්පත් භාරගෙන ඒවායේ ගණිතමය නිරවද්‍යතාවය තහවුරුකොට වවුචරයට අදාලව හා ප්‍රමානවත් පරිදි ප්‍රභව ලියවිලි ඇත්ද යන්න පරික්ෂා කර, මුදල් රෙගුලාසි හා විවිධ මුදල් සීමාවන් තුළ ගෙවීම් සඳහා නිසි අධිකාරි බලය ලැබී ඇත්ද යන්න තහවුරු කොට වියදම සහතික කිරිම සඳහා ඉදිරිපත් කිරිම.
02. සහතික කරන ලද වවුචර්පත් මුදල් පොතට ඇතුලත් කොට නිවැරදි පරිදි ගෙවීම් කටයුතු කිරීම සඳහා මුදල් පොත නඩත්තු කිරිම හා චෙක්පත්ලිවීම.
03. වැටුප් සැකසීමේ කටයුතු කිරිම හා වැටුප් අවකරණ ලේඛන නඩත්තු කිරිම.
04. වාර්ෂික විසර්ජන ගිණුමට අදාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි සකස් කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු සැකසීම.
05. සුළු මුදල් අත්තිකාරම් පවත්වාගෙන යාම හා සුළු මුදල් පොත නඩත්තු කිරිම, බැංකු ගනුදෙනු ඇතුළුව, මුදල් පෙට්ටියේ දෛනික මුදල් ශේෂ තහවුරු වන පරිදි පවත්වාගෙන යාම.
06. ගබඩාව භාරව කටයුතු කිරිම, ගබඩාවට භාණ්ඩ ලබාගැනීම හා නිකුත් කිරිම, අදාල ලේඛන නඩත්තු කිරිම.
07. වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම හා ඊට අදාළ පාර්ශවයන් හා සම්බන්ධව දත්ත එක්රැස් කිරීම.
08. වැය ලෙජරය නඩත්තු කිරීම, වරින්වර අයවැය ලේඛනයේ ප්‍රතිපාදන හා සත්‍ය වියදම් සසඳා බලා ඉදිරි කාලය සඳහාප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම්, අදාළ පරිදි මුදල් රෙගුලාසි 66 පරිදි ප්‍රතිපාදන මාරුකර ගැනීම මෙන්ම අමතර ප්‍රතිපාදන මාරුකර ගැනීම හා අමතර ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු කිරිම.
09. පොදු තැන්පත් ගිණුම පවත්වාගෙන යාම සහ මාසික ගිණුම් වාර්තා සකස්කර නියමිත දිනට පෙර යැවීමට කටයුතු කිරිම.
10. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පරික්ෂා කිරීම, මාසික අග්‍රිම අයදුම්පත පිළියෙල කර නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත යැවීම.
11. සියලුම මිළදී ගැනීමේ කටයුතු හා ඊට අදාළ ටෙන්ඩර් කැඳවීම, මිළදී ගන්නා ලද වට්ටෝරු භාණ්ඩ විෂයභාර නිළධාරි වෙත නිසි පරිදි භාරදීම හා සියලු මිළදි ගැනීම් වෙනුවෙන් වවුචර්පත් සැකසීම හා ඒවා ගෙවීම් කිරිමට ඉදිරිපත් කිරිම.
12. ගෙවීම් කිරිමේදි අය කරන ලද මුද්දර ගාස්තු හා රඳවුම් බදු නියමිත දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරිම.

13. මාසිකව බැංකු සැසඳුම් විස්තරය සකස් කිරිම.
14. බාහිර රාජ්‍ය ආයතන වෙත ප්‍රතිපාදන මාරුකිරිම හා ඊට අදාළ හර නිවේදන ගිණුම්ගත කිරිමේ කටයුතු සිදුකිරිම.

❖ අභ්‍යන්තර විගණන අංශය

දෙපාර්තමේන්තු වේ පාලන,සංවර්ධන හා ගිණුම් යන අංශ තුනෙහි කාර්යයන් නියමිත විධිවිධාන හා රෙගුලාසි යටතේ ඉටු කරනු ලබන්නේ ද යන්න පිළිබඳව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

එම කාර්ය පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලබයි.

1. අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම හා අනුමත කර ගැනීම.
2. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
3. කාර්තුමය වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම.
4. විගණන විමසුම් නිකුත් කිරීම
5. කළමණාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම
6. විගණන විමසුම් හා ගිණුම් කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම හා විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීම.

සංවිධාන සටහන


අධ්‍යක්ෂ
ආයතන අංශය
අභ්‍යන්තර විගණන අංශය
සංවර්ධන අංශය
ගිණුම් අංශය
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
ශාඛා ප්‍රධානී (ආයතන)
ශාඛා ප්‍රධානී (ගිණුම්)
සංවර්ධන නිලධාරී 33
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී (8)
කළමනාකරණ සේවා නිලධාරී (1)
කළමනාකරණ සේවා නිලධාරී (1)
කළමනාකරණ සේවා නිලධාරී (4)
රියදුරු (2)
කාර්යාල කාර්ය සහායක (3)
නිවාස භාරකරු

පරිච්ඡේදය - 02

2.1 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින මිලියන දෙකකට අධික කිතුනු ජනතාවගේ සුභසාධන කටයුතු සඳහා ක්‍රියාත්මක වන 52 කාර්ය මණ්ඩලයකින් යුතු දෙපාර්තමේන්තුවකි.

කිතුනු ජාතික සිද්ධස්ථාන, දේවස්ථාන හා ආගමික ස්ථාන සංවර්ධනය, නත්තල්, පාස්කු වැනි ආගමික උත්සව සඳහා දායකත්වය සැපයීම, අධ්‍යාත්මික හා කිතුනු ආගමික වැඩසටහන් සංවිධානය, කිතුනු කලා ශිල්ප සුරැකීම හා ප්‍රවර්ධනය මෙම දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

දෙපාර්තමේන්තුව මගින් කිතුණු දූ දරුවන්ගේ බයිබලීය දැනුම වර්ධනය කිරීමට බයිබල් දැනුම මිනුම තරඟයක් ද, කිතුනු කලාකරුවන් ඇගයීම සඳහා ධර්මප්‍රභාෂ්වර උත්තමාචාර උළෙලක් ද, ජාතික මට්ටමේ නත්තල් වැඩසටහනක් ද වාර්ෂික ව සංවිධානය කරනු ලබන අතර, කතෝලික සභාව විසින් සංවිධානය කරනු ලබන අධ්‍යාත්මික හා සංස්කෘතික වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම ද සිදු කෙරේ.

නවීන තාක්ෂණය හා ඒකාබද්ධ වෙමින් වැඩසටහන් සම්පාදනය කරමින් එමගින් ළමා හා තරුණ පරපුර තුල අධ්‍යාත්මික නවෝදයක් ඇති කරලීමට ද, දේශීය කිතුණු කලා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම හා නව පරපුර වෙත එකී කලා සම්ප්‍රදායන් රැගෙන යාම සඳහා ත් අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර ඇත.

වාර්ෂික අයවැය දෙපාර්තමේන්තුව මඟින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර එම ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ නංවන්නේනම් කිතුනු ජනතාව වෙත වඩාත් ප්‍රශස්ථ සේවාවක් ලබා දීමට දෙපාර්තමේන්තුවට හැකි වනු ඇත.

එම්වතුරි පින්තු.
අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය - 03

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		194,741,000	147,956,000	ඒසීඒ-3
-	තැන්පතු		21,100	250,596	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		2,394,474	2,143,828	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**197,156,574**	150,350,424	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**197,156,574**	150,350,424	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		133,965	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		197,022,609	150,350,424	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
45,305,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	44,010,811	35,866,140	
9,950,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	7,922,515	7,036,778	ඒසීඒ-2(ii)
8,150,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	7,486,316	6,853,182	
-	පොළී ගෙවීම්	8	-	-	
144,595,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	127,564,860	98,362,681	
208,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**186,984,502**	148,118,781	
	මූලධන වියදම්				
1,800,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	1,292,294	511,548	
2,600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,547,677	1,052,195	
57,300,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	48,720,021	18,884,040	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
300,000	හැකියා වර්ධනය	14	297,870	142,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
62,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**52,857,862**	20,589,783	
	තැන්පතු ගෙවීම්		20,450	250,421	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,542,916	2,374,388	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,563,366	2,624,809	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		243,405,730	171,333,373	
270,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(46,383,121)	(20,982,949)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(46,383,121)	(20,982,949)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	32,498,997	30,382,780
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	6,821,524	5,675,582
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**39,320,521**	**36,058,362**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		6,816,699	5,671,407
දේපළ පිරියත හා උපකරණ සංචිතය		32,498,997	30,382,780
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	4,825	4,175
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**39,320,521**	**36,058,362**

පිටු අංක 07 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 66 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ගණකාධිකාරි
ඩබ්ලිව්.පී.සේනාධීර	එම්. චතුරි පින්තු	එස්.එල්.එම්.නිබ්‍රාස්
ලේකම්	අධ්‍යක්ෂ	දිනය : 2026.02.20
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	
දිනය :2026.02.23	දිනය :2026.02.20	

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

Prince Senadeera
Secretary
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
135, Shreemath Anagarika Dharmapala Mawatha
Colombo 07.

එම්. චතුරි පින්තු
අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
3 වන මහල, නො. 180,
ටී.බී. ජයා මාවත, කොළඹ 10.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජීසීජ්-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සතාය 2025 රු.	2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,744,772	2,190,605
අග්‍රිම ලැබීම්	194,741,000	147,956,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,834,511	1,662,646
තැන්පතු ලැබීම්	21,100	250,596
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**199,341,383**	**152,059,847**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	51,614,592	42,616,454
සහනාධාර සහ මාරුකිරීම්	134,005,129	104,317,471
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,936,630	72,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	133,965	-
අත්තිකාරම් ගෙවීම්	3,499,857	1,687,398
තැන්පතු ගෙවීම්	20,450	250,421
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**191,210,623**	**148,943,744**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,130,760**	**3,116,103**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	8,130,760	3,116,103
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**8,130,760**	**3,116,103**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(8,130,760)**	**(3,116,103)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය:203 දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය :02 සංවර්ධන වැඩසටහන්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	0	-
රු	25,000.01	වැඩි	0	-
	එකතුව			-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1 නොමැත	0	-
2		
3		
4		
එකතුව		-

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	0	-
රු	25,000.01	වැඩි	1	137,707
	එකතුව		1	137,707

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1. NB2558 වෑන් රථය අනතුරට ලක් වීම.	1	137,707
එකතුව	1	137,707

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	1
	ගණන	රු.137,707
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

....
ගණකාධිකාරී
එස්.එල්.එම්.නිබ්‍රාස්
දිනය : 2026.02.20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 203

දෙපාර්තමේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන වැඩසටහන්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

	අගය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	....	-	-
(ii)	රු. 25,000.01 වැඩි	....	-	-
	එකතුව		-	-

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	නොමැත						
2							
	එකතුව						

සටහන - ඇමුණුම (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

....

ගණකාධිකාරි

එස්.එල්.එම්.නිබ්‍රාස්

දිනය : 2026.02. 20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (iii)

දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 203
වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන වැඩසටහන්

Cumulative Commitment/ Liability Report for the Year - 2025

To
Department of Christian Religious Affairs (203)
From
Director General, ,
Department of State Accounts, ,
General Treasury, Colombo1. .

Printed by Thakshilaf
New Table No :SA-92
Old Table No :--
Report Date 2/10/2026 3:54:29 PM

NEW CIGAS FINAL 2025 REPORTS

Nature	Commit_No	Date	To_whom	Vote	Commitment	Commit_bal	L_Date	Liability_amt	Revised_Lia	Paid	Liability_Bal	Reported_By
Govt	COM12-1000	31 Dec 2025	POSTMASTER GENERAL	203-2-01-000-1402-000/11-P	2,050.00	0.00	31 Dec 2025	2,050.00	0.00	0.00	2,050.00	203
Govt	COM12-1001	31 Dec 2025	Director - Department of Muslim Religious and Cultural Affairs	203-2-01-000-1405-000/11-P	57,370.00	0.00	31 Dec 2025	57,370.00	0.00	0.00	57,370.00	203
Govt	COM12-1002	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1002-000/11-P	14,723.00	0.00	31 Dec 2025	14,723.00	0.00	0.00	14,723.00	203
Govt	COM12-1003	31 Dec 2025	M.C.N.PINTO - DIRECTOR	203-2-01-000-1002-000/11-P	9,424.66	0.00	31 Dec 2025	9,424.66	0.00	0.00	9,424.66	203
Govt	COM12-1004	31 Dec 2025	M.C.N.PINTO - DIRECTOR	203-2-01-000-1202-002/11-P	35,280.00	0.00	31 Dec 2025	35,280.00	0.00	0.00	35,280.00	203
Govt	COM12-1005	31 Dec 2025	Director - Department of Muslim Religious and Cultural Affairs	203-2-01-000-1407-000/11-P	62,823.66	0.00	31 Dec 2025	62,823.66	0.00	0.00	62,823.66	203
Govt	COM12-1006	31 Dec 2025	ARIYADASA STORES	203-2-01-000-1205-000/11-P	1,260.00	0.00	31 Dec 2025	1,260.00	0.00	0.00	1,260.00	203
Govt	COM12-1007	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1002-000/11-P	4,623.76	0.00	31 Dec 2025	4,623.76	0.00	0.00	4,623.76	203
Govt	COM12-1008	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1101-000/11-P	1,019.00	0.00	31 Dec 2025	1,019.00	0.00	0.00	1,019.00	203
Govt	COM12-1009	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1101-000/11-P	9,636.66	0.00	31 Dec 2025	9,636.66	0.00	0.00	9,636.66	203

34

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

Cumulative Commitment/ Liability Report for the Year - 2025

To
Department of Christian Religious Affairs (203)

Printed by **Thakshilaf**
New Table No **:SA-92**

Govt	COM12-1010	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1101-000/11-P	10,697.98	0.00	31 Dec 2025	10,697.98	0.00	0.00	10,697.98	203
Govt	COM12-1011	31 Dec 2025	Director - Department of Christian Religious Affairs	203-2-01-000-1002-000/11-P	4,712.33	0.00	31 Dec 2025	4,712.33	0.00	0.00	4,712.33	203
Govt	COM12-1012	31 Dec 2025	H.I.D.WEERASENA	203-2-01-000-1101-000/11-P	1,570.66	0.00	31 Dec 2025	1,570.66	0.00	0.00	1,570.66	203
Govt	COM12-1013	31 Dec 2025	W.W.S.B. FERNANDO	203-2-01-000-1101-000/11-P	4,000.00	0.00	31 Dec 2025	4,000.00	0.00	0.00	4,000.00	203
Govt	COM12-997	31 Dec 2025	EXPRESS WATER SYSTEMS (PVT) LTD	203-2-01-000-1403-000/11-P	4,515.00	0.00	31 Dec 2025	4,515.00	0.00	0.00	4,515.00	203
Govt	COM12-998	31 Dec 2025	Ceylon Electricity Board	203-2-01-000-1403-000/11-P	84.79	0.00	31 Dec 2025	84.79	0.00	0.00	84.79	203
Govt	COM12-999	31 Dec 2025	Sri Lanka Telecom PLC	203-2-01-000-1402-000/11-P	11,686.26	0.00	31 Dec 2025	11,686.26	0.00	0.00	11,686.26	203
PVT	2512-800	31 Dec 2025	LANKA HARDWARE AND CONSTRUCTION	KAC-203-2-01-011-2205-000/11-P	2,300,673.23	0.00	31 Dec 2025	2,300,673.23	0.00	0.00	2,300,673.23	265

This is a computer-generated document. No signature is required.

Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development..

-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 203
වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන වැඩසටහන්

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු	අදාල නොවේ							
....								
....								
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
....								
....								
එකතුව								
3. වෙනත් (පෞද්ගලික අංශය)								
....								
....								
එකතුව								
මුළු එකතුව								

....
ගණකාධිකාරී
එස්.එල්.එම්.නිබ්‍රාස්
දිනය : 2026.02.20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

36

ඇමුණුම - (v)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 203
වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන වැඩසටහන්

පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු	අදාල නොවේ							
....								
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
....								
එකතුව								
3. වෙනත් (පෞද්ගලික අංශය)								
....								
එකතුව								
මුළු එකතුව								

....
ගණකාධිකාරී
එස්.එල්.එම්.නිබ්‍රාස්
දිනය : 2026.02.20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

* නම වාර්තාකරණ ආයතනයට අදාළ නම් පමණක් මෙම ආකෘතිය භාවිත කළ යුතු ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 02 සංවර්ධන වැඩසටහන්

		රු.
(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2025 ඇස්තමේන්තුගත වෙන්කිරීම	නොමැත
(2)	ඉහත (1) ට අදාළ 2025 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම	නොමැත
(3)	2025 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව	නොමැත
(4)	2024 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2025 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව (ඇත්නම්)	නොමැත
(5)	2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව	නොමැත
(6)	2024 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පැම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමවල එකතුව	නොමැත
(7)	2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමවල එකතුව	නොමැත
(8)	2024 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2025 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	නොමැත
(9)	2025 වර්ෂය වෙනුවෙන් 2025 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	නොමැත
(10)	2025 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව {(3+4+5) - (6+7) - }8+9)	නොමැත
(11)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව	නොමැත
(12)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2025 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	නොමැත
(13)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමවල එකතුව (10 + 11 - 12)	නොමැත

....
ගණකාධිකාරි
එස්.එල්.එම්.නිබ්‍රාස්
දිනය : 2026.02.20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

* තම වාර්තාකරණ ආයතනයට අදාළ නම පමණක් මෙම ආකෘතිය භාවිත කළ යුතු ය.

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 203

වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන වැඩසටහන්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නොමැත		

....
ගණකාධිකාරි
එස්.එල්.එම්.නිබ්‍රාස්
දිනය : 2026.02.20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 203

දෙපාර්තමේන්තුවේ නම: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය	2025.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය	2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
			(රු.)	(රු.)		
1	ලංකා බැංකුව හයිඩ් පාර්ක් ශාඛාව	7041207	12,716,101	-	-	2025 දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

....

ගණකාධිකාරි

එස්.එල්.එම්.නිබ්‍රාස්

දිනය : 2026.02. 20

S.L.M. Nibras
Accountant (Acting)
Department of Christian Religious Affairs

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - (අදාල නොවේ)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතුකරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තථ්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසානය		
පුනරාවර්තන	268,000,000	208,000,000	186,984,502.29	89.90%
ප්‍රග්ධන	62,000,000	62,000,000	52,857,861.40	85.25%

3.7. මූ.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානයකරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමෙන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	මැතිවරණ කොමිෂන් සභාව	නිලධාරින්ගේ මැතිවරණ දීමනා ගෙවීම	116,629.75	116,629.75	116,629.75	100%
2	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැවැත්වූ දිව්‍ය පූජාව සඳහා	70,000.00	70,000.00	70,000.00	100%
3	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් වූ කතෝලික ආගමික ස්ථාන පිරිසිදු කිරීම	1,750,000.00	1,750,000.00	1,750,000.00	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්තව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,398,800	1,398,800	—	—
9152	යන්ත්‍රෝපකරණ	31,100,197.34	31,100,197.37	—	—
9153	ඉඩම	—	—	—	—
9154	අස්පෘශ්‍ය වත්කම්	—	—	—	—
9155	ජීව විද්‍යාත්මක වත්කම	—	—	—	—
9160	කෙරීගෙන යන වැඩ	—	—	—	—
9180	බදු දෙන ලද වත්කම	—	—	—	—

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඒ/සී/ඩීසීආර්/2/2026/17   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2026 මැයි 31 දින

අධ්‍යක්ෂ

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්ථන වැය විෂයයන් 05ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.1,500,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.796,706ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 84 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.500,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.288,449ක් ඉතිරි වී තිබූ අතර එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 58ක් විය.

(ඇ) පුනරාවර්ථන වැය විෂයයන් 02ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.310,000ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 04ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 02ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය අතර සියයට 35 සිට සියයට 162ක පරාසයක් දක්වා වූ විචලතාවයක් පැවති බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

සම්මත පරිදි නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(3)	මුදල් රෙගුලාසිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන විමසුම්වල පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද පොදු 47 වාර්තාවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරි මුදල් වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සුදුසු පරිදි කටයුතු කළ යුතු ය යන්න සඳහන් වුවද, 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අයිතම 22ක් විකිණිය යුතු බවත්, අයිතම 11ක් අලුත්වැඩියා කල යුතු බවත්, අයිතම 12ක් විනාශ කළ යුතු බවත් හඳුනාගෙන තිබුණද එම ක්‍රියාමාර්ගයන් ගැනීමේදී ප්‍රමාදයන් සිදුවී තිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතුය යන්න සඳහන් වුවද, දෙපාර්තමේන්තුව සතු වාහනයක් සම්බන්ධයෙන් 2025 වර්ෂය වෙනුවෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

5

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද, 2025 වර්ෂයේ මුල් මාස 04 සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම 2025 ජනවාරි 23 දින සිදු කර තිබුණි.

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර තිබුනද එම වාර්තාවේ පහත අඩුපාඩු පැවතුණි.

(අ) කාර්යසාධන වාර්තාවේ 7 පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති අනුකූලතා වාර්තාවේ 7.1 අනු ඡේදය මගින්, DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04ක් වත් අදාල වර්ෂය තුල පවත්වා තිබීමට අනුකූල වේ යන්න දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) අනුකූලතා වාර්තාවේ 8.1 අනු ඡේදය අනුව අංක 01/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම යන්නට අනුකූල වනබව සඳහන් කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුකූලතා වාර්තාවේ 8.3 අනු ඡේදය අනුව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර ඇති බවට අනුකූල වන බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) අනුකූලතා වාර්තාවේ 8.4 අනු ඡේදය අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම යන්නට අනුකූල වන බව සඳහන් කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) අනුකූලතා වාර්තාවේ 9.5 අනු ඡේදය 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය විම නැවත පරීක්ෂා කිරීම යන්න සඳහන් වුවද, ආයතනය සතුව වාහන දෙකක් පැවතියද ඉන්ධන පරීක්ෂාව සිදු කර තිබුණේ එක් වාහනයක් සඳහා පමණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරණ භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව 2025 වර්ෂය සඳහා වූ වත්කම් මිලදී ගැනීම හා අපහරණයන් පිළිබඳ තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේදී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා තිබූ තලවිල වාරිකා නිවාසය පිහිටි ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

(අ) මුදල් රෙගුලාසි 882 ප්‍රකාරව ඇප තැබිය යුතු තනතුරකට වැඩ බැලීම සඳහා පත් කරනු ලබන නිලධාරියෙකු විසින් තමා ස්ථිරව එම තනතුරට පත් කරනු ලැබුවෙකු සේ සලකමින් ඇප තබන ලෙස ඔහුට නියම කල යුතුය යන්න සඳහන් වුවද දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා 2025 මාර්තු 17 දින සිට පත් කර තිබූ නිලධාරියා ඇප තැබීම සිදුකර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 883 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය තනතුරු වලට අලුතින් පත් කර ඇති නිලධාරීන් සහ දැනටමත් ඇප තබා ඇති නිලධාරීන් පිලිබඳ ස්ථාන මාරු කිරීම්, මිය යාම යනාදිය සම්බන්ධයෙන් සෑම මසක් පාසාම අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා විගණකාධිපතිවරයාට වාර්තා කල යුතු බව සඳහන් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

7

4.4 කළමණාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුව සතු වාහනයක් සම්බන්ධයෙන් සිදු වූ අනතුරකට අදාල රු.137,707 ක්වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5 යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

2025 අප්‍රේල් 28 දිනැති කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ DMA/ADM/07/CIRCULAR දරන චක්‍රලේඛයේ 2.2 (i) ඡේදය අනුව සෑම කාර්තුවක් තුලම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් ප්‍රවර්ධන වර්ෂයට අදාලව පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයට අදාල දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 60ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 54ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 03ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02ක්ද වශයෙන් තනතුරු 06ක් පුරප්පාඩුව පැවතුණි.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

8

පරිච්ඡේදය 04
කාර්ය සාධක දර්ශක - ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

මූල්‍ය වගකීම	සැලසුම්කර ඇති ප්‍රධාන කාර්යයන්	ප්‍රමුඛ කාර්යය සාධක දර්ශක	ඇස්තමේන්තුගත සංශෝධිත වාර්ෂික ප්‍රතිපාදය රු.මි. (අදාලනම් පමණි)	ප්‍රගතිය		බැහැරවීමක් ඇත්නම් එයට හේතුව
				භෞතික (ප්‍රමාණාත්මක %)	මූල්‍ය %	
1508(17)	මුල්‍ය අවශ්‍යතා වලදී දේවස්ථාන සහ අනෙකුත් ආගමික සංවිධානවලට සහය විම. අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා ආගමික සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම. ආකල්ප සංවර්ධන හා මා පිය වන්දනා වැඩසටහන්	ආගමික සහජීවන වැඩසටහන් පවුල් පෝෂණ වැඩසටහන් තරුණා සඳහා වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්. විශ්වාස ප්‍රවර්ධන වැඩසටහන් බන්ධනාගාර ගත වූවන් සංක්‍රමනිකයන් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන්	2.5	100%	91%	දිට්වා සුලිකුණාටුව හේතුවෙන් නොවැම්බර් හා දෙසැම්බර් මස පැවැත්වීමට තිබූ වැඩසටහන් අවලංගු වීම
1508(18)	පාස්කු මංගල්‍ය වැඩසටහන්	දීප ව්‍යාප්ත පසම් තරගාවලිය පැවැත්වීම පසම් සම්මාන ප්‍රදානෝත්සවය පාස්කු අතිරේකය වතාරික වැඩසටහන් සඳහා පදවි වෙත මුල්‍ය පහසුකම් සැපයීම	2.5	100%	100%	
	ජාතික නත්තල් වැඩසටහන්	නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරගය පැවැත්වීම ජාතික නත්තල් වැඩසටහන ජාතික කැරොල් තරගාවලිය හා ත්‍යාග ප්‍රධානෝත්වය	2.5	100%	93%	දිට්වා සුළි කුණාටුව හේතුවෙන් මඩකලපුව පැවැත්වීමට තිබූ ජාතික නත්තල් උත්සවය අවලංගු වීම.
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	ජාතික නිදහස් උත්සවය වෙසක් උත්සවය	0.5	100%	100%	

2-1409	ජනවන්දනා, කිතුණු කලා ශිල්ප හා සංස්කෘතික කටයුතු ධර්ම ප්‍රභාෂ්වර සම්මාන උළෙල. සිග්නිස් සම්මාන උළෙල	ක්‍රිස්තියානි ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ධර්ම ප්‍රභාෂ්වර සම්මාන උළෙල ජන සන්නිවේදන වැඩසටහන් කෙටි චිත්‍රපට වැඩමුළුව, තරගාවලිය හා සම්මාන උළෙල	7.25	100%	99%	සාමාන්‍ය ඉතිරියකි.
	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන්	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	0.5	100%	100%	
04-1508	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම	සිද්ධස්ථාන මංගල්‍යයන් 24 ක් සඳහා දායකත්වය ලබා දීම	8	100%	99%	සාමාන්‍ය ඉතිරියකි.
05-1508	ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම්	බයිබල් දැනුම මිණුම තරගාවලිය	5.8	100%	100%	
		ආගමික හා දහම්පාසල් ක්‍රියාකරකම්	3.2	100%	98%	සාමාන්‍ය ඉතිරියකි.
17-1501	දහම් පාසල් ගුරුවරුන් සඳහා පහසුකම් සැපයීම	දහම් ගුරු පුස්තකාල දීමනාව	119.645	100%	86%	අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අවුරුදු 3ට අඩු දහම් ගුරුවරුන්සඳහා නිල ඇඳුම් දීමනාව නොගෙවා පුස්තකාල පොත් දීමනාව පමණක් ගෙවීම
11-2205	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	සිද්ධස්ථාන 02 ක් සඳහා ප්‍රතිපාදන ලබා දීම	40	100%	83%	මඩු සිද්ධස්ථානයේ භෞතික හා තාක්ෂණික මිල උච්චාවචනයන් සඳහා ප්‍රතිපාදන මාරු කරන ලද මුදල උපයෝජනය නොවීම හා දෙසැම්බර් මස බිල්පත් සඳහා අක්මුදල් නොලැබීම.
14-2205	පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ආගමික ස්ථාන සංවර්ධනය	ආගමික ස්ථාන 06 සඳහා ආධාර ලබා දීම	7	100%	77%	සාමාන්‍ය ඉතිරියකි.
18-2205	ක්‍රිස්තියානි ආගමික ස්ථාන හා දේවස්ථාන සඳහාපහසුකම් සැලසීම	ක්‍රිස්තියානි ආගමික ස්ථාන හා දේවස්ථාන 11ක් සඳහා	10.3	100%	99%	දෙසැම්බර් මස බිල්පත් සඳහා අක්මුදල් නොලැබීම.

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
හඳුනා ගත්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය 0%-49% 50%-74% 75% - 100%
1508(17)	අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා ආගමික සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම.	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	හානිකර මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම	75%-100%
			දුම්කොළ භාවිත පාලනය කිරීම සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ සැලැස්ම සියලුම රටවලට අදාල වන පරිදි ශක්තිමත් කිරීම හා ක්‍රියාවට නැංවීම	
1508(18)	ජාතික නත්තල් වැඩසටහන් සංවිධානය කිරීම, නත්තල් තැපැල් චිත්‍ර තරගය පැවැත්වීම.	"ජේසු උපත" මඟින් ගෙනෙන ප්‍රේමයේ පණිවිඩය ජාතික උත්සවය හරහා සමාජානුයෝජනය කරලීම.	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75% - 100%
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75% - 100%

02-1409	කිතුනු ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	ලේඛණ,රංගනය,මඟින් පෞරුෂත්වය වර්ධනය කිරීම.	කිතුණු කලා රසාස්වාදන උසස් මට්ටමකට ගෙන ඒම හා එ සඳහා උනන්දුවක් දක්වන්නන් ඇගයීමකට ලක් කිරීම.අනාගතයට ප්‍රශස්ත කලාකරුවන් දයාද කිරීම.	75% - 100%
	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%
	ජනවන්දනාව, කිතුනු කලාශිල්ප හා සංස්කෘතික කටයුතු කිතුණු ගීතිකා වැඩසටහන් පැවැත්වම, ධර්ම ප්‍රභාෂ්වර කිතුණු සම්මාන උළෙල හා කලා භූෂණ සම්මාන උළෙල සඳහා දායකත්වය ලබා දීම, විවිධ කලා හා සාහිත්‍යා වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%

04-1508	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75% - 100%
05-1508	ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම්	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75% - 100%
17-1501	දහම් පාසල් ගුරුවරුන් සඳහා පහසුකම් සැපයීම	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75%-100%
11-2205	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%

14-2205	පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ආගමික ස්ථාන සංවර්ධනය		පෞරාණික වටිනාකම් සහිත දේවස්ථාන සහ ආගමික ස්ථාන වැනි කිතුණු උරුමයන් අනාගත පුරපුර වෙනුවෙන් රැක ගැනීම	75%-100%
18-2205	දේවස්ථානයන්හි ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%

දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන බොහෝ කාර්යයන් ප්‍රමාණාත්මක ව මැනිය නොහැකි කාර්යයන් වීම මත නිශ්චිත ව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුව ද දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර අනුව හඳුනාගන්නා ලද තිරසර අරමුණු කරා බොහෝ දුරට ළඟා වීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. සියලුම වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සංවිධානය කොට තිබූ වැඩසටහන් කිහිපයක් සඳහා ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව විසින්ම සම්පාදනය කරගනිමින් හැකිතාක්දුරට ඉලක්කගත කාර්ය සාධනය කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යේෂ්ඨ	03	02	01
තෘතියික	01	01	00
ද්විතියික	50	46	04
ප්‍රාථමික	06	04	02

6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී යන තනතුරු 03න් සහකාර අධ්‍යක්ෂ තනතුර පමණක් පුරප්පාඩුව පවතී. සංවර්ධන නිලධාරීන් නොමැති පලාත්වල වැඩසටහන්, තරඟ හා සංවර්ධන කටයුතු දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් යොදවා ආවරණය කර ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව පවත්නා මානව සම්පත අභිප්‍රේරණය කරමින් ඔවුන්ගේ ආයකත්වය උපරිම වශයෙන් දෙපාර්තමේන්තු කාර්ය සාධනය පවත්වා ගැනීමට උපයෝජනය කොටගෙන ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැවුවරය සැකසූදිනය	පුහුණු වැඩසටහන	ගෙවීම් කරන්නාගේනම	වියදම (රු)
1	නිලධාරීන් 1 ක් සඳහා	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	30,000.00
2		විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	65,000.00
3		නායකත්ව කුසලතා සංවර්ධනය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	6,500.00
4		නිවාඩුභාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	6,500.00
5		විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම.	ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය	6,000.00
6	නිලධාරීන් 2 ක් සඳහා	Office System with Digital File Management	දූරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	30,000.00

7	නිලධාරීන් 1 ක් සඳහා	Certificate Program on ICT and AI	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	30,000.00
8		පරිගණක මුද්‍රණ රටා පාඨමාලාව	Sri Lanka Institute of Printing	25,500.00
9	නිලධාරීන් 2 ක් සඳහා	Government Payroll System	දූරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	30,000.00
10	නිලධාරීන් 1 ක් සඳහා	Public Procurement New Guidelines	දූරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	7,500.00
11	නිලධාරීන් 2 ක් සඳහා	Project Management පාඨමාලාව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	24,000.00
12		Certificate Course in ICT & AI for Office Productivity	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	60,000.00

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල ප්‍රකාශ/ ගිණුම්නියමිතදිනටඉදිරිපත්කොටතිබේ**			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6.	වෙනත්	අදාල නොවේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කරපවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5.	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැතිඅංක171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයඅනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයු තුකිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			

5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 4ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කෝම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු ප් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ශණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ		
9.3	වාහන ලෝග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 3.1 ඡේදයේ සඳහන් වියි විධාන ප්‍රකාරව ,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ ටල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බලකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාෂ වලින් අනාවරණය වූ හා ගැලපුම කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇරතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබු ප්‍රතිපාදන ඒවාගේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අටසානයේ දී ඉදිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට **එළඹීම**	අනුකූල වේ		

12	**රජයේ නිලධාරින් ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල විම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබිම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුලු කර තිබිම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙමු.රේ.571 ප්‍රකාරව කටයුතු කර තිබිම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබිම.	අනුකූල වේ		
14.2	මු.රේ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වි මාසයක් ඇතුළත නිරවුල් කර තිබිම	අනුකූල වේ		
14.3	මු.රේ.371 ප්‍රකාරව අනුමත සිමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබිම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසදුම් කිරිම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවිම් සිදු කොට තිබිම	අනුකූල වේ		
15.2	රැස්කර තිබු ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබිම	අනුකූල වේ		
15.3	මු.රේ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දේපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයා ගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභි ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභි ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම.	අනුකූල වේ		

19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරිම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරිම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳවගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබිම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්විම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දි ඇති අඩු පාඩු නිවිරදි කොට තිබිම.	අනුකූල වේ		